අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/01/14/04/04

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2023. 10. 23

චක්‍රලේඛ අංක:36/2023

සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කොට්ඨාස අධ්‍යක්ෂවරුන්,
සියලු ම විදුහල්පතිවරුන් (රජයේ හා රජයේ අනුමත පාසල්)
සියලු ම පරිවේණාධිපති හිමිවරුන් (විද්‍යායතන පිරිවෙන්) වෙත,

**තරුණ විද්‍යාඥයා පර්යේෂණ තරගය -2023**

**උපදෙස් සහ තොරතුරු සංග්‍රහය**

## 1.0 හැදින්වීම

විසි එක්වන සියවසේ අභියෝග ජයගත හැකි විද්‍යා සාක්ෂරතාවයෙන් යුත් හා නව්‍යතාවයෙන් යුතුව සිතීමට හැකි අනාගත පරපුරක් බිහි කිරීම විද්‍යා අධ්‍යාපනයේ ප්‍රමුඛ කාර්යය වේ. ඒ අනුව සිසුන් තුළ විද්‍යාත්මක චින්තනය හා පාසල් තුළ පර්යේෂණ සංස්කෘතියක් ඇති කිරීම අරමුණු කර ගනිමින් අධ්‍යාපන අමාත්‍යාංශය, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු හා කලාප අධ්‍යාපන කාර්යාල එක්ව තරුණ විද්‍යාඥයා පර්යේෂණ තරගාවලිය 2023 වසරේ සිට ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

## 2.0 අරමුණු

1. සිසුන් තුළ විද්‍යාත්මක පර්යේෂණ කුසලතා වැඩිදියුණු කිරීම
2. සිසුන් තුළ ගැටළු විසඳීමේ සහ තොරතුරු විශ්ලේෂණ කුසලතා වැඩි දියුණු කිරීම.
3. සිසුන් තුළ විද්‍යාත්මක සන්නිවේදන කුසලතා වැඩි දියුණු කිරීම.
4. පාසල් ප්‍රජාව තුළ පර්යේෂණ සංස්කෘතියක් ඇති කිරීම.

## 3.0 පර්යේෂණ ක්ෂේත්‍ර

- සිසු පර්යේෂණ පහත සඳහන් එක් විෂය පථයක් ආවරණය වන පරිදි සිදු කළ හැක.
  - පරිසර විද්‍යාව (Environmental Science)
  - ජීව විද්‍යාව (Life Science)
  - භෞතික විද්‍යාව (Physics)
  - පරිගණක විද්‍යාව (Computer Science)
  - රසායන විද්‍යාව (Chemistry)

ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் / Hon. Minister
+94112784832
+94112784825
minister.education@moe.gov.lk

ලේකම් / செயலாளர் / Secretary
+94112784811
+94112785162
secretary.education@moe.gov.lk

3.1 සිසු පර්යේෂණ ඇගයීමේ දි පහත නිර්ණායක ඒ සඳහා යොදා ගනු ලැබේ.

- Explaining the statement of problem
  පර්යේෂණ මාතෘකාව /ගැටළුව විස්තර කිරීම.
- Justification of method
  පර්යේෂණ සඳහා ක්‍රමෝපායන් හා තාක්ෂණයන් සාධාරණීකරණය කිරීම
- Rusults and Conclutions
  ප්‍රතිඵල හා නිගමන
- Novelty of concepts and students originality of work
  සංකල්පයේ අලුත් බව හා සිසුන්ගේම පර්යේෂණයක් බවට සහතික වීම.
- Presentation skills
  ඉදිරිපත් කිරීමේ කුසලතා
- Discussion with the jury
  විද්වත් මණ්ඩල සාකච්ජාව

මෙම ඉදිරිපත් කිරීම සඳහා (presentation) විනාඩි 15 ක කාලයක් හා පර්යේෂණයට අදාළ ප්‍රශ්න කිරීම් (Discussion) සඳහා විනාඩි 10ක කාලයක් හිමි වේ.

3.2 තරගය සඳහා සිසුන් කාණ්ඩ ගත කරන ආකාරය

| කාණ්ඩය | අදාළ ශ්‍රේණිය |
|---|---|
| I කාණ්ඩය | 6 - 9 ශ්‍රේණි |
| II කාණ්ඩය | 10- 13 ශ්‍රේණි |

- මෙහිදී සිසුන්ට කේවල හෝ කණ්ඩායම් වශයෙන් පර්යේෂණ ඉදිරිපත් කළ හැකිය. කණ්ඩායම් වශයෙන් ඉදිරිපත් කිරීමේ දී කණ්ඩායම උපරිම සාමාජික සංඛ්‍යාව 5 කට සීමා විය යුතුය.

- ඉදිරිපත් කිරීමේ මාධ්‍යය සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි යන ඕනෑම භාෂා මාධ්‍යයක් විය හැකිය.

**4.0 සිසුන් තෝරා ගැනීම**

4.1 පාසල් මට්ටම

සෑම සිසුවෙක්ම කිසියම් හෝ විද්‍යාත්මක පර්යේෂණයක් කිරීමට දිරි ගැන්විය යුතුය. ඒ අනුව පාසල් මට්ටමේ සිදු කරන පර්යේෂණ සංඛ්‍යාව සීමා නොකෙරේ.

4.2 කලාප මට්ටමේ තරගය

- ඒ ඒ කාණ්ඩ යටතේ පාසල් මට්ටමින් තෝරා එවනු ලබන පර්යේෂණ ඇගයීම සඳහා සුදුසු කමිටුවක් පත් කර එම පර්යේෂණ අදාළ නිර්ණායක භාවිතා කරමින් ඇගයීමට ලක් කිරීමට කටයුතු කළ යුතුය.
- මෙහිදී එක් එක් කලාපය මගින් එක් එක් කාණ්ඩය යටතේ ප්‍රශස්ත මට්ටමේ පවතින පර්යේෂණ 06 ක් තෝරා පළාත් තරගය සඳහා යොමු කළ යුතුය.

4.3 පළාත් මට්ටමේ තරගය

කලාප මට්ටමින් ඉදිරිපත් කළ පර්යේෂණ වාර්තා ඇගයීමට සුදුසු කමිටුවක්, පළාත් මට්ටමින් පත් කර ගත යුතු අතර එම යෝජනා අදාළ නිර්ණායක අනුව ඇගයීමට ලක් කර එක් එක් කාණ්ඩය යටතේ ප්‍රශස්ත මට්ටමේ පවතින පර්යේෂණ 06 ක් තෝරා ජාතික තරගාවලියට යොමු කළ යුතුය.

4.4 ජාතික මට්ටමේ තරගාවලිය

- ජාතික තරගය පැවැත්වෙන දිනය හා ස්ථානය අධ්‍යාපන අමාත්‍යාංශය මගින් තීරණය කර දැනුම් දෙනු ලැබේ.
- මෙහිදී ජාතික මට්ටම සඳහා තෝරා ගත් සෑම පර්යේෂණයක්ම පිළිබඳව අදාළ ශිෂ්‍යයා හෝ ශිෂ්‍ය කණ්ඩායම විසින් විද්වත් මණ්ඩලයක් ඉදිරිපිට ඉදිරිපත් කිරීමක් කළ යුතුය. මේ සඳහා Microsoft Powerpoint ඉදිරිපත් කිරීම භාවිතා කළ යුතුය.

**<u>කාල රාමුව</u>**

කලාප තරග - ඔක්තෝබර් : 30 ට පෙර

පළාත් තරග - නොවැම්බර් : 20 ට පෙර

**<u>විශේෂ කරුණු</u>**

මෙම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීමේ දී ඇති වන ඕනෑම ගැටළුවක් සම්බන්ධව අවසන් තීරණය අධ්‍යාපන ලේකම් සතුවේ.

මෙම උපදෙස් අනුව ඔබ විද්‍යාලයේ /කලාපයේ/ පළාතේ සිසු දරුවන් අතර විද්‍යාත්මක පර්යේෂණ ප්‍රචලිත කිරීමේ කටයුතු සිදු කරනු ඇතැයි අපේක්ෂා කරමි. ශ්‍රී ලාංකික සිසු පරපුරේ අනාගත අභිවෘද්ධිය වෙනුවෙන් සිදු කරන මෙම කාර්යය සඳහා ඔබගෙන් ලැබෙන සක්‍රිය දායකත්වය අගය කරමි.

එම්.එන්.රණසිංහ

අධ්‍යාපන ලේකම්